# සූර වීර යකා පැංචා



සෙනුලි රශ්මිතා මෙනන්

## සූර වීර යකා පැංචා

සෙනුලි රශ්විතා මෙනන්

### වෙනත් කෘතීන්

- අපේ සීයා තාත්තා සුරංගනා ලෝකයට ගිය හැටි
- සමනල කඩය
- බිය වුන පූස් රාළ

2023 නොවැම්බර් 15

ISBN 978-624-206-595-3

# පිදුම

මට හැමදාම ආදරය කරන

අම්මා, තාත්තා, නංගී ඇතුළු පවුලේ සියලු

දෙනාටත්,

මගේ සියලුම යහළුවන්ටත්

මට අකුරු කියවූ චන්ද්‍රලතා ගුරු මෑණියන්ටත්,

චම්පිකා ගුරු මෑණියන්ටත්, නිල්මිණි ගුරු

මෑණියන් ඇතුළු මට සිප් කිරි පෙවූ සියලු ගුරු

මෑණිවරුන් සහ පියවරුන්ටත්,

ග්‍රන්ථකරණය සඳහා නිරන්තරයෙන් අප

දිරිමත් කරන සෙනෙවිරත්න ගුරු පියාණන්ට සහ

අපගේ විදුහල්පතිතුමියටත්

මාගේ මේ කෘතිය  බැති සිතින් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන, ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

# සූර වීර යකා පැංචා

පැංචා කියන්නේ පුංචි පිරිමි ළමයෙක්. එයාගෙ අම්මයි, තාත්තයි දෙන්නම නැහැ. එයා ජීවත් වුණේ ඈත ගමක පැල්පතක, එයාගේ අත්තම්මාත් එක්ක.

පැංචා අත්තම්මාට හරිම ආදරෙයි. ඒ වගේ ම කීකරුයි.

අත්තම්මගේ හැම වැඩකටම පැංචා උදව් කළේ හරිම ආසාවෙන්. අත්තම්මත් ඒ වගේමයි. පැංචාට පණ වගේ ආදරෙයි.

පැංචා පුංචි වුණාට ඇඟ පතින් ලොකුයි. එයාගෙ ඇඟ කළුම කළුයි. පැංචාට සුදුම සුදු දත් ටිකක් තිබුණා. එයාගෙ කොණ්ඩය කොච්චර පීරුවත් හැමතිස්සේම තිබුණෙ කපුටු කූඩුවක් වගේ.

මේ පෙනුම නිසා ගමේ අය පැංචට කිව්වේ යකා පැංචා කියලයි. මේ නම නිසා යකා පැංචා හිටියේ හරිම දුකෙන්.

යකා පැංචා ගමේ පොඩි ළමයි එක්ක සෙල්ලම් කරන්න ආසයි. ඒත් පැංචා ළමයි සෙල්ලම් කරන තැන්වලට ගියාම මොකද වෙන්නෙ දන්නවා ද?

සමහර ළමයි බයේ දුවනවා. තවත් සමහරු ‘‘ මෙන්න යක් පැංචෙක් ඇවිල්ලා’’ කියලා විහිළු කරනවා. ඒ විතරක් නොවෙයි, යකා පැංචාට තවත් හොඳටම දුක හිතෙන දෙයක් තියෙනවා.

ඒ තමයි ගමේ සමහර අම්මලා චූටි බබාලා කන්නෙ නැති වුණාම ‘‘අන්න පුතේ යකෙක් එනවා’’ කියලා බය කරන එක.

මේ වගේ වෙලාවට යකා පැංචාට ගොඩක් දුක හිතෙනවා.

එයා දුවලා ගිහින් අත්තම්මාව තුරුළු කරගෙන අඬනවා. අත්තම්මා පැංචාගේ හිස අතගාමින් පැංචාව සනසනවා.

‘‘දුක් වෙන්න එපා මගෙ පුතේ. මගේ පුතා හරිම හොඳ අහිංසක ළමයෙක්. පුතාට කවදාවත් වරදින්නේ නැහැ.’’

කියලා අත්තම්මා කියනවා.

ගම කෙළවර තිබුණු කැළෑව ළඟ එදාත් ගමේ ළමයි සෙල්ලම් කරමින් සිටියා.

අහිංසක යකා පැංචා ආසාවෙන් ඒ දිහා බලා සිටියෙ ලොකු ගහකට මුවා වෙලා.

එකපාරටම ගර්... ගර්.... කියලා ලොකු සද්දයක් එක්ක දුඹුරු පාට ලොකු ගුලියක් ළමයි දිහාවට ආවා.

'' අනේ අපිව මේ තඩි වලහගෙන් බේරාගන්න'' ළමයි කෑගහමින් ඇඬුවා. තවත් සමහර ළමයි හති දමමින් දිව්වා. ගල් මුල්වල හැප්පිලා, වැටිලා තුවාල කරගත්තා.

මේක බලාගෙන හිටපු යකා පැංචාට හොඳටම දුක හිතුණා.

පැංචා වලහා ඉදිරියට දුවගෙන ගිහින් හයියෙන් කෑගැහැවුවා. යකා පැංචාව දැකපු වලහා බයවෙලා කැලේ ඇතුළටම දිව්වා. පැංචා හරි සතුටින් ළමයි දිහා බැලුවා.

'' ආයේ නම් නපුරු වලහා ඔයගොල්ලොන්ට කරදර කරන එකක් නැහැ.'' පැංචා කිව්වා.

ළමයි හැමෝම දුවගෙන ඇවිත් පැංචාව තුරුළු කරගත්තා.

''බොහෝම ස්තූතියි පැංචා, ඔයා අද ඉඳල යකා පැංචා නෙවෙයි, අපේ වීර පැංචා'' කියමින් හැමෝම සතුටින් උඩ පැන්නා.

පැංචාටත් හරිම සතුටුයි.

එදා ඉඳන් හැමදාම පැංචා හවසට එයාගෙ යාළුවොත් එක්ක සෙල්ලම් කළා.

ගමේ හැමෝ⁣මත් පැංචාට ගොඩක් ආදරේ කළා. කවදාවත් එයාට විහිළු කළේ නැහැ.

ඉතිං පුංචි යාළුවනේ අපිත් කවදාවත් කෙනෙකුගේ බාහිර පෙනුමට විහිළු කරන්න හොඳ නැහැ.

මොකද ඒ වගේ අය ගොඩක් හොඳ ගතිගුණ තියෙන අය වෙන්න පුළුවන්.

ඒ නිසා අපි ආදරය සහ කරුණාව කිසිම භේදයක් නැතිව හැමෝටම බෙදා දෙමු.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

**සෙනෙවිරත්න මහලේකම්**

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ

ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01